**ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් අඩංගු සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 23 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමණාකරන විගණන වාර්තාව 2023 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6 .3 (අ) | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. | 1.6.4 (අ) |
| 1.6 .3 (ආ) | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. | 1.6.4 (ආ) |
| 2..3 (අ) | පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන නියාමනය සඳහා විධිමත් නෛතික රාමුවක් ඇතිකිරීම සඳහා කටයුතු කළ යුතුය. | 2.3 (අ) |
| 2..3 (ඇ) | 2019 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ නොකෙරෙන කාල සීමා සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමට කටයුතු නොකළ යුතුය. | 2.3 (ඇ) |
| 2.4 | ආයතන සංග්‍රහය, ජාතික අයවැය චක්‍රලේඛ සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ණය අයකිරීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කිරීමේ වගකීම ඉටු නොකළ නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට මුදල් රෙගුලාසි 104 (2) “ආ” ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2.1 |
| 3.2 (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, නියමිත ආකෘතියේ පිළියෙල කර නියමිත කාළ සීමා තුළ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. | 3.4 (ආ) |
| 3. 3 | රජයේ මුදල් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කරමින් අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ අරමුණු ඉටුකර ගැනීම සඳහා පමණක් ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කළ බව හා විනිවිදභාවයෙන් කටයුතු කළ බව තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගනිමින් ප්‍රසම්පාදනයන් මෙහෙයවිය යුතුය. | 3.5 |
| 3.5 | දෙපාර්තමේන්තුව ගෙවූ වැටුප්වලින් හිඟ මුදල් වහාම අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් රෙගුලාසි 104 (2) “ආ” ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හෝ කටයුතු කළ යුතු අතර, පිරිස් පාලන හා වැටුප් පාලන අංශ අතර යාවත්කාලීන අඛණ්ඩ සම්බන්ධතා තහවුරු කෙරෙන පාලන ක්‍රම හඳුන්වා දීමටද කටයුතු කළ යුතුය. | 3.7 (ආ) |

| | | |
|---|---|---|
| 3.7 | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මිලදී ගෙන තිබුණු සියළුම යන්ත්‍ර ඵලදායි ලෙස උපයෝජනය කිරීමට හෝ ආයුර්වේද රෝහල්වල හෝ ආයුර්වේද සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම සඳහා ලබාදීමට කටයුතු කළ යුතු අතර මෙම අක්‍රමිකතාවය සඳහා දායක වූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. | 3.8 (ඉ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිත්‍යානුකූලව දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරාගෙන නොතිබුණු ඉඩම් 12 ක වටිනාකම වූ රු. 2,318,020,000 ක් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු අතර නිත්‍යානුකූලව දෙපාර්තමේන්තුවට අයිතිය පවරා ගෙන තිබුණු ඉඩම් 07 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | පෙන්වා දී ඇති කරුණු සමග එකඟ වන බව හා ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බැවින් දැනට පවරාගෙන ඇති ඉඩම්වල තක්සේරු අගය ලබා ගැනීමෙන් අනතුරුව ගිණුම්වල අදාළ ගැලපීම් සිදු කිරිමට කටයුතු කරන බව. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කඩිනම් පියවර ගෙන ගිණුම්වල අදාළ ගැලපීම් සිදු කළ යුතුය. |
| (ආ) | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද CGO/ASM/Policy/Cir/(VOL III) හා 2023 ජනවාරි 18 දිනැති අංක 1/2023 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට වාර්තා කර තිබුණු දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලිවල වටිනාකම රු. 567,396,547 ක් වූ අතර ගිණුම්ගත කළ වටිනාකම රු.1,161,120,186 ක් වූයෙන් රු.593,723,635 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය. රු. 563,416,490 ක් වටිනා ගොඩනැගිලි 14 ක් කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට වාර්තා නොකිරීමත්, බොරැල්ල රෝහලේ ගොඩනැගිලි රු. 93,934,658 ක් අඩුවෙන් හා තිරප්පනේ ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිලි රු. 7,430,962 ක් වැඩියෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට ව | පෙන්වා දී ඇති කරුණු සමග එකඟ වන බව. ඉඩම් වල අයිතියේ හා තක්සේරු අගයේ පවතින ගැටළු හේතුවෙන් මෙම අඩු පාඩු සිදු වී ඇති බව හා කඩිනමින් කටයුතු අවසන් කර ඉදිරි ගිණුම් වාර්තාවල අගයන් නිවැරදි කරන බව. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කඩිනම් පියවර ගෙන ගිණුම්වල අදාළ ගැලපීම් සිදු කළ යුතුය. කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට තත්‍ය කරුණු වාර්තා කළ යුතුය . |

| | | | |
|---|---|---|---|
| | වාර්තා කිරීමත්, රු 56,196,547 ක් වටිනා ගොඩනැගිලි 12 ක් කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට වාර්තා කළ නමුත් ගිණුම්ගත නොකිරීමත් මෙම වෙනසට හේතුවී තිබුණි. | | |
| (ඇ) | සිගාස් පරිගණක මුද්‍රිත සටහන් ප්‍රකාරව වෙනත් යන්ත්‍ර හා උපකරණ වැය විෂයය යටතේ රු.10,905,422ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගලපා තිබුණද ඊට අදාල විස්තරාත්මක තොරතුරු පිළියෙල කර නොතිබුණු අතර ආරම්භක ශේෂයන්ට සිදු කරන ලද එම සංශෝධන පිළිබඳ ගිණුම් සටහන් වලින් හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි. | ඉකුත් වර්ෂයේ ගිණුම් වල පැවති අඩුපාඩු සකස් කිරිම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග කටයුතු කල අතර ඒ අනුව මෙම වෙනස ඇති වූ බව හා මේ සම්බන්ධව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග සාකච්ජා කර දෝෂ නිවැරදිව හඳුනාගෙන නිවැරදි කිරිමට කටයුතු කරන බව. | ගිණුම්වල සිදුකරන අසාමාන්‍ය ගැලපීම් සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ සිගාස් පරිගණක පද්ධතියේ පවත්වා තිබුණු මූල්‍ය නොවන වත්කම් ලේඛනය අනුව රු.90,875,713ක් වූ කාර්යාල උපකරණ හා විදුලි උපකරණ ශේෂය රු.91,218,614 ක් ලෙස රු.342,901ක් වැඩියෙන්ද යථොක්ත ලේඛනය අනුව රු.275,315,783 ක් වූ වෛද්‍ය උපකරණ ශේෂය රු.273,099,263 ක් ලෙස රු.2,216,520 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | සිගාස් පරිගණක පද්ධතියේ ඇතුළත් වත්කම් ලේඛණයේ හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සමස්ථ අගයන් සමාන වන බව හා පෙන්වා දීඇති ඇති දෝෂ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග සාකච්ජා කර නිවැරදි කිරිමට කටයුතු කරන බව. | මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. |
| (ඉ) | මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු පරිගණක උපාංග ශේෂය, විදුලි උපකරණ ශේෂය සහ වෛද්‍ය උපකරණ ශේෂය පිළිවෙලින් රු. 5,881,397 ක්, රු. 14,835,143 ක් සහ රු. 275,315,783 ක් විය. එසේ වුවද, පිළිවෙලින් ඉකුත් වර්ෂවල සිදුකළ රු. 10,375,439 ක රු. 6,273,197 ක සහ රු. 3,638,628 ක මිලදීගැනීම් අදාළ විෂයයන් යටතේ නොදක්වා කාර්යාල උපකරණ යටතේ දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ සිදු කර තිබුණු රු. 20,729,160 පරිගණක මිලදී ගැනීම් පරිගණක උපාංග යටතේ මූල්‍ය නොවන වත්කම්වල දක්වා නොතිබුණි. | වර්ගීකරන දෝෂ ඉදිරි වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව හා පරිගණක මිලදී ගැනීම සෞඛ්‍ය අමාත්‍යාංශ වැය විෂයන් හරහා සිදු කළ බැවින් ද්වීගණන දෝෂයක් ඇති නොවන පරිදි මාරු නියෝග ලබා ගැනිමෙන් අනතුරුව ඉදිරි වර්ෂයේ වත්කම් ලැයිස්තුවට ඇතුළත් කරන බව. | මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. අත්පත් කර ගන්නා ස්ථාවර වත්කම් අදාළ මුදල් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් යටතේ වාර්තා කෙරෙන බවට වගබලා ගත යුතුය. |
| (ඊ) | කල්බදු වාරික ගෙවීම් ක්‍රමය යටතේ 2012 වර්ෂයේදී ටොයෝටා ලංකා ආයතනයෙන් මිලදී ගෙන තිබුණු පිරිවැය රු.8,400,000 ක් වූ වෑන් රථයක් කල්බදු කාලසීමාවෙන් | අදාල වෑන් රථය 2022 නොවැම්බර් 29 දින දෙපාර්තමේන්තුව වෙත පවරාගැනිමේ කටයුතු කර ඇති | අදාල වටිනාකම මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනතුරුව දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණද, මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | අතර අතපසුවීමකින් එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට නොහැකි වී ඇති බව. | |
| (ඉ) | වැඩ අවසන් ගොඩනැගිලි හා ව්‍යුහවල පිරිවැය ප්‍රාග්ධනිත නොකර 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉදිකිරීම් සඳහා දැරූ සම්පූර්ණ වියදම කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.1,035,539,978 ක් දක්වා වර්ධනය වී තිබුණි. | 2018 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වැඩ අවසන් කළ ගොඩනැගිලි අවසන් වැඩ වාර්තා සහ ව්‍යුහවල අනුකූලතා සහතිකය ලැබෙන තෙක් ඉදිකිරීම් සඳහා දැරූ සම්පූර්ණ වියදම කෙරීගෙන යන වැඩ ගිණුම යටතේ දක්වා ඇති බව හා මේ සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වැඩ අවසන් ගොඩනැගිලි හා ව්‍යුහවල පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 විගණන සාක්ෂි නොවීම**

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතුව රු.93,944,999 ක් වටිනා වාහන පවතින බව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණු නමුත් සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර නොතිබුණු බැවින් දෙපාර්තමේන්තුව සතු සියලු වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපනයවන බවට තහවුරු කර ගැනීමට නොහැකි විය. | සිගාස් පරිගණක පද්ධතිය පවත්වාගෙන යන මූල්‍ය නොවන වත්කම් ලේඛණයේ රු.93,944,999/- ක් වටිනා වාහනවල තොරතුරු ඇතුලත් කර ඇති බව හා දෙපාර්තමේන්තුව සතු සියලු වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6. 3 බැරකම් හා බැදීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබාගත් ඖෂධ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 11,334,668 ක් ගෙවිය යුතුව පවතින බව එම සංස්ථාවේ ගිණුම් අනුව තහවුරු වූ නමුත් අදාළ බැරකම රු. 7,027,978 ක් ලෙස දෙපාර්තමේන්තුවේ බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. | 2023 පෙබරවාරි 28 දිනවන විට වාර්තා වූ සියළුම බැරකම් ගිණුමට ඇතුළත් කර ඇති බව හා විගණන නිරීක්ෂණයේ සඳහන් කාරණය පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ තොරතුරු සමග සැසඳුම් කර නිවැරදි බැරකම හඳුනා ගෙන බැදීම් හා බැරකම් ප්‍රකාශනයේ දැක්විය යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂවලදී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබා ගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,272,068ක් ගෙවිය යුතුව පවතින බව එම සංස්ථාවේ ගිණුම් අනුව තහවුරු වූ නමුත් එම බැරකම දෙපාර්තමේන්තුවේ බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | 2023 පෙබරවාරි 28 දිනවන විට වාර්තා වූ සියළුම බැරකම් ගිණුමට ඇතුළත් කර ඇති බව හා විගණන නිරීක්ෂණයේ සඳහන් කාරණය පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු කරන බව. | සියළු බැරකම් නිවැරදිව හඳුනා ගෙන බැදීම් හා බැරකම් ප්‍රකාශනයේ දැක්විය යුතුය. |

## 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | ඇප තැන්පත් ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය ප්‍රකාරව, ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තෙමසක් තුළ නිරවුල් කළ යුතු වුවද, ස්ථාන මාරුවී 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ක ට වැඩි නිලධාරීන් 09 දෙනෙකුගේ එකතුව රු.314,439 ක් වූ ණය ශේෂ හා මාස 08 කට වැඩි රු.177,760 ක ණය ශේෂයක් නිරවුල් කර නොතිබුණි. | ස්ථාන මාරුවී 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ක කාල සීමාවක් ඉක්මවා තිබුණු නිලධාරීන් 10 දෙනෙකුගේ එකතුව රු.316,249 ක නොපියවූ ණය ශේෂවලින් රු.1810 ක එක් ශේෂයක් නිරවුල් කර ඇති බව හා එකතුව රු. 179,023 ක ණය ශේෂ සහිත නිලධාරීන් 06 දෙනෙකුගේ තොරතුරු නොමැති බව. | ආයතන සංග්‍රහයේ හා ජාතික අයවැය චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කිරීමේ වගකීම ඉටු නොකළ නිලධාරීන්ගෙන් අදාළ මුදල අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 (2) "ආ" ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, 4.2.5 වගන්තිය ප්‍රකාරව නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදල්වලින් හෝ අයකර ගත යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමගොස් මාස 20 ක් ඉක්ම වූ නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.393,510 ක ණයශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ එකතුව රු. 62,050 ක් වූ නිලධාරීන් 03 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු සොයා ගත නොහැකි බව. ණය ශේෂ එකතුව රු.181,160ක් වූ නිලධාරීන් 02 දෙනෙකුගේ විශ්‍රාම පාරිතෝෂික මුදල් ගෙවා නොමැති බැවින් ඒවා ගෙවීමේ දී ණය අයකර ගැනීමට කටයුතු කරන බව. ණය ශේෂ එකතුව රු.150,300ක් වූ නිලධාරීන් 03 දෙනෙකුගේ සේවා කාලය ප්‍රමාණවත් නොවන බැවින් විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂිකයකට හිමිකම් නොමැති බව. | නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් නොකළ, විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීමට අදාල සේවා කාළය සම්පූර්ණ නොකළ නිළධාරීන්ගේ විශ්‍රාම ගැන්වීම ණය අයකර ගැනීමෙන් තොරව අනුමත කළ හා ලිපිගොණුවල ආරක්ෂාව සම්බන්ධයෙන්නොසැලකිලිමත්ව කටයුතු කළ නිලධාරීන්ගෙන් මෙම මුදල අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 (2) "ආ" ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5, 4.6 හා 6.3 වගන්ති, 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛනයෙහි 03 (ආ) ජේදය හා 2017 | ණය ශේෂ එකතුව රු. 367,544 ක් වූ නිලධාරීන් 04 දෙනෙකුට අදාළ මරණ පාරිතෝෂික මුදල් ගෙවා | ආයතන සංග්‍රහය හා අදාළ මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු අතර පෞද්ගලික ලිපිගොණුවල ආරක්ෂාව සම්බන්ධයෙන් |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනයෙහි 04 ඡේදය ප්‍රකාරව මිය ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත්, 2022 දෙසැම්බර් 31 දිනට මිය ගොස් මාස 12 ඉක්ම වූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 599,344 ක් වූ ණය ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | නොමැති බැවින් ඒවා ගෙවන අවස්ථාවේ දී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව හා ණය ශේෂ එකතුව රු.231,800 ක් වූ නිලධාරීන් 03 දෙනෙකුට අදළ පෞද්ගලික ලිපිගොනු සොයා ගත නොහැකි බව. | නොසැලකිලිමත්ව කටයුතු කළ නිලධාරීන්ගෙන් අදාළ මුදල අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 (2) “ආ” ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21.3 වගන්තිය ප්‍රකාරව, වැඩ තහනමට ලක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කිරීම අත්‍යාවශ්‍ය වුවද, එසේ පරීක්ෂණ කටයුතු අවසන් නොකිරීම නිසා වැඩ තහනමට ලක්වී වර්ෂ 1ත් වර්ෂ 3ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු. 425,060 ක් ද, වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබුණු නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු. 127,060 ක් ද, අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | වර්ෂ 1ත් වර්ෂ 3ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 03 දෙනෙකුගේ රු.275,000 ක් වූ ණය අදාළ විනය පරීක්‍ෂණය අවසන් වූ පසු අයකර ගැනීමට කටයුතු කරන බව. රු. 150,060 ක් වූ අනෙක් නිලධාරියාට අදාල ණය නිරවුල් කරන ලෙස ලිපි මගින් දැනුම් දී ඇති බව හා වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබුණු නිලධාරීන් 05 දෙනාගේ ණය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | පසුවිපරම් කිරීම හා ප්‍රමාණවත් අධීක්ෂනය මගින් ණය අයකර ගැනීම කඩිනම් කළ යුතුය. ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමේ වගකීම ඉටුනොකළ නිලධාරීන්ගෙන් මෙම මුදල අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 (2) “ආ” ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ඉ)(ii) ප්‍රකාරව සේවය හැර ගිය නමුත් නැවත සේවයේ පිහිටුවා නොතිබුණු නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කර පදිංචිය පිළිබඳව විස්තර විමසා ප්‍රාදේශීය ලේකම් මගින් එම නිලධාරීන්ගේ වත්කම් පිළිබඳව තහවුරු කර ගැනීමෙන් අනතුරුව නීතිපති මගින් ණය මුදල අයකර ගත යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විට සේවය හැරගිය නිලධාරීන් 22 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය වූ රු. 1,147,660 ක් එකී විධිවිධාන ප්‍රකාරව අයකර ගෙන නොතිබුණු අතර ඉන් සියයට 67 ක් හෙවත් රු.766,160 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් පැරණි ණය ශේෂ විය. | චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට ප්‍රමාණවත් තොරතුරු අනාවරණය කර ගැනීමට නොහැකි වී ඇති බව. එකතුව රු. 384,230 ක් වූ නිලධාරීන් 06 දෙනෙකු වෙත ණය නිරවුල් කරන ලෙස ලිපි මගින් දැනුම් දී ඇති බව හා එකතුව රු.381,930 ක් වූ නිලධාරීන් 10 දෙනෙකුට අදළ ආපදා ණය ගොනු සොයා ගෙන ඉදිරි කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට ප්‍රමාණවත් තොරතුරු අනාවරණය කර ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගෙන් මෙම මුදල අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 (2) “ආ” ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයට අදාලව සකස් කර යාවත්කාලීන කළ දෙපාර්තමේන්තු චක්‍රලේඛ මේවන විට නිකුත් කර ඇති අතර ගිණුම් අංශය, වැටුප් අංශය හා සැපයුම් අංශ මගින් මේ වනවිට දැනුවත් කර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයට අදාළ උපදෙස් ලිපි ආයතන ප්‍රධානීන් වෙත යොමු කර ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනත | පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ ශාලා හෝ ආයුර්වේද බෙහෙත් ගබඩා ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රමය භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි. | ආයුර්වේද පනතෙහි 10 වගන්තිය ප්‍රකාරව සම්භාහන මධ්‍යස්ථාන නියාමනය කළ නොහැකි බව හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නියෝගය මත සංචාරක මණ්ඩලයේ අනුමැතියලත් හෝටල් සහ අනිකුත් සංචාරක ආකර්ශන ආයතන සඳහා පමණක් ලියාපදිංචිය ලබාදීම අනුමත කර ඇති බව. | පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන නියාමනය සඳහා විධිමත් නෛතික රාමුවක් ඇතිකිරීම සඳහා කටයුතු කළ යුතුය. |

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 770 (4) | ධාවනයෙන් ඉවත්කර වසර ගණනාවක් ගතව තිබුණු ජීප් රථයක් හා වෑන් රථයක් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට 2023 මැයි 20 වන විටද, කටයුතු කර නොතිබුණි. | ජීප් රථයේ අළුත්ඩියා කටයුතු වලින් සියයට 80 ක් පමණ මේ වනවිට අවසන් කර ඇති අතර වෑන් රථයට අවශ්‍ය අමතර කොටස් ගෙන්වා ගැනිමට නොහැකිවීම හේතුවෙන් අළුත්වැඩියා කටයුතු ප්‍රමාද වී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 880 හා 881 | 2023 මාර්තු 31 දින වන විටත් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අයත් ආයතන 09 ක ඇප තැබිය යුතු නිලධාරීන් 20 දෙනෙකු ඇප තැබිමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් මේ සම්බන්ධව දැනුවත් කර ඇති බව හා කඩිනමින් ඉතිරිකිරිමේ ගිණුමක් විවෘත කර, ඇප තැන්පත් කර වාර්තා කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දුන් බව. | මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතුකළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 1647(ආ) | වාහනද ඒවායේ උපකරණද ඇතුළුව සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවද, දෙපාර්තමේන්තුව සතුව ඇති යතුරු පැදි ඇතුළු වාහන 55 ක් සම්බන්ධයෙන් එකී විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මාණ්ඩලික නිලධාරයෙකුගේ අධීක්ෂණය යටතේ සුදුසු සමීක්ෂණ මණ්ඩලයක් පත්කර දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධ විධිමත් සමීක්ෂණයක් පැවැත්වීමට කඩිනම් පියවර ගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | මුදල් රෙගුලාසි 1647(ඉ) | වාහන භාර නිලධාරින් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව ඒ ඒ වාහනයේ වර්ගය හා මෝස්තරයද, ලියාපදිංචි කිරීමේ අංකයද, තමාට භාරදුන් දිනයද, පැවරූ දිනය හා ඒ පිළිබද විස්තරද වෙනත් නිසි තොරතුරුද දැක්වෙන ලැයිස්තුවක් තබාගත යුතු වුවත්, එකී විධි විධාන ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියළුම වාහන සම්බන්ධව එක් එක් වාහනයට අදාල විස්තර ඇතුළත් වාර්තාවක් ප්‍රවාහන නිලධාරි භාරයේ පවතින අතර එය විධිමත් පරිදි ලේඛණගත කර පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) ඡේදය | වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු. 63,411,490 ක් ගෙවා තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව. කොරෝනා වසංගත තත්වය මත පැමිණීමේ ලේඛණ මත පදනම්ව පමණක් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සිදුව ඇති අතර 2023 මාර්තු 01 දිනෙන් පසු අතිකාල හා නිවාඩු දින ගෙවීම් නිර්දේශ කිරීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් සකස් කරන වාර්තා සමග සසඳා බලා ගෙවීම් කිරීම අනිවාර්ය කර ඇති බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ නොකරන අවස්ථාවලදී කාලය පදනම් කරගෙන ගණනය කෙරෙන අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමට කටයුතු නොකළ යුතුය. |
| (ඈ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.5 ඡේදය | රාජ්‍ය ආයතන විසින් නව ගාස්තුවක් හඳුන්වා දීමට පෙර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතු වුවද ආයුර්වේද පනත හෝ වෙනත් එවැනි ලිඛිත නීතියක් මඟින් ප්‍රතිපාදන සලසා නොගෙන සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සේවා ලාභීන්ගෙන් එකතුකළ රු. 21,564,057 ක් වූ විවිධ ගාස්තු භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරන විකුණුම් සහ ගාස්තු 20.03.99.00 යන ආදායම් සංකේතය යටතේ රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සියළුම ආදායම් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමත ආදායම් සංකේතාංකයක් යටතේ රාජ්‍ය ආදායමට බැර කිරීමටත්, ආදායම් ගණන්දීමේ නිලධාරියා ලෙස ආයුර්වේද කොමසාරිස්වරයාට කටයුතු කිරීමටත් හැකිවන පරිදි නිතීමය පසුබිම විධිමත් පරිදි සකස් කර ගැනිමටත් 2023 වර්ෂයේදී කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ තීරණයන් අනුව ඉදිරියේදී කටයුතු කිරීමට සැලසුම් කර ඇතිබව හා ඒ අනුව ගාස්තු සංශෝධනයටත් අළුතින් ගාස්තු හඳුන්වා දිමටත් ඉදිරියේදී කටයුතු කරන බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (අ) ,(ඇ) හා උපලේඛන අංක 01 | ආදායම් සහ හිඟ ආදායම් ප්‍රමාණයන් පැහැදිලිව දැක්වෙන අයුරින් වාර්තා පවත්වා නොතිබුණි. එකතු කළ ආදායම් රැස්කිරීමේ ගිණුම්වල හෝ තැන්පත් ගිණුම්වල නොතබා එළැඹෙන මාසයේ පළමු සතිය තුළ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද 2020 ජනවාරි 01 සිට 2022 අප්‍රේල් 30 දක්වා පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණු රු.4,336,500ක් වූ ගෙවන වාට්ටු ගාස්තු 2022 අගෝස්තු 08 දින දක්වාම රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ රැස්කළ එකතුව රු.1,163,684 ක් වූ සංචාරක නිවාස හා නේවාසිකාගාර ආදායම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ආදායම් සංකේතාංක 20.2.01.01ට බැර කර නොතිබුණි. | 2022 අගෝස්තු මස සිට මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙලක් සකස් කර ඇති අතර ආදායම් විධිමත් පරිදි වර්ගීකරණය කර ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර අරමුණු හා ප්‍රතිපත්ති වෙනස් කිරීමේදී ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තු පදනමින් ප්‍රගතිය වාර්තා කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු අතර 2023 අප්‍රේල් 20 දින වන විටත් ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි. | පෙන්වා දී ඇති කරුණු සමග එකඟවන බව හා අදාළ අංශ දැනුවත් කර ඉදිරියේදී මෙවැනි තත්ත්ව ඇති නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. | සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය කාලීන සංශෝධන සහිතව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු අතර එහි සාර්ථකත්වය ඇගැයීම සඳහා ප්‍රගති වාර්තා පිළියෙල කළ යුතුය. |

## 3.2 කාර්යයභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය අනුව 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කළ යුතු වුවද, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 877.2 ක් වැය කර තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ වෙනම ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු අතර සංවර්ධන වැඩසටහනේ රෝගී ප්‍රතිකාර සේවා ව්‍යාපෘතිය යටතේ වැටුප්, දීමනා, ගිවිසුම්ගත සේවා ඇතුළු පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ගෙන නිලධාරීන් 218 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 148.3 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 4.5 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 152.8 ක් වැයකර තිබුණි. ඒ අනුව අනෙකුත් දිස්ත්‍රික්ක ආවරණය කරමින් ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පුනරාවර්තන වියදම් පමණක් දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් මගින් ආවරණය කරමින් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කිරීම මතභේදයට තුඩුදෙන කරුණකි. | පෙන්වා දී ඇති කරුණු සමඟ එකඟ වන අතර මෙම සේවාව මේවන විට ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක නොවන අතර ව්‍යාපෘති කාල සීමාව අවසන් වී ඇති බැවින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලුම් කළද වෙනම ප්‍රතිපාදන සලසා නොමැති බව. මෙම සේවාවට අයත් නිලධාරීන් සඳහා වැටුප් හා දීමනා ගෙවීම දෙපාර්තමේන්තු රෝගී සත්කාරක සේවා ව්‍යාපෘතිය යටතේ සිදු කරන අතර දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මගින් ඉදිකර පවත්වාගෙන යනු ලබන කාර්යාල නඩත්තු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බව හා ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාවන් වඩාත් සැලසුම් සහගතව ඉටු කිරීමට 2023 ක්‍රියාකාරී සැලැස්මක් අනුමත කර ඇති අතර ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ඉදිරියේ දී ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව අදාල පාර්ශව සමඟ සාකච්ඡා ආරම්භකර ඇති බව. | ව්‍යාපෘති කාලසීමාව අවසන්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවේ නම් එය සතුව පැවැති භෞතික හා මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය අනුමැතීන් ලබාගෙන ඒ අනුව ව්‍යාපෘති කාර්යාල නඩත්තුව හා කාර්ය මණ්ඩල සඳහා දරන වියදම් සීමා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 350ක් වූ පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ II වන අදියර 2020 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 04 ක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2019 අප්‍රේල් 03 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගෙන තිබුණි. එසේවුවද, 2020 වර්ෂයේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ රු.1,500,000 ක ප්‍රතිපාදන සලසා ගෙන කාර්යයන් 04 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද පාරම්පරික වෛද්‍යවරුන් ඇගැයීම යන එක් කාර්යයක් පමණක් ඉටුකර ඒ සඳහා රු.697,408 ක් වැයකර තිබුණි. | එකල රටතුළ පැවති ආර්ථික ස්ථායිතාවය අනුව මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ප්‍රතිපාදන යම් ප්‍රමාණයක් වෙන් කර තිබුණු නමුත් සැලසුම් කල පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත සැලැස්ම අනුව ප්‍රතිපාදන ලැබිය යුතු බව හා ඒ අනුව වෙන් කෙරෙන ප්‍රතිපාදන කළමනාකරණය කර ගනිමින් සැලසුම් කළ එක් එක් | රටේ පවතින ආර්ථික තත්ත්වය සමග ව්‍යාපෘතියේ අරමුණු හා ක්‍රියාත්මක කිරීමේදී පැනනැගුණු ගැටළු නැවත සමාලෝචනය කර වර්තමාන ආර්ථික තත්ත්වයට ගැලපෙන පරිදි ව්‍යාපෘතිය ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය අනුමැතීන් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ක්‍රියාකාරකම ඉටුකරන බව. | |
| (ඇ) | ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියම ඇතුළත්වන පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සැකසීම සඳහා ඉකුත් වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද රු. මිලියන 25 බැගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම කාර්යය ඉටුකර නොතිබුණි. | මෙම කාර්යය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දුන් ප්‍රතිපාදන රටේ ඇති වූ ආර්ථික අර්බුධකාරි තත්වය හමුවේ 2022 අගෝස්තු මස සංශෝධිත අයවැයෙන් අහෝසි වූ බැවින් ආරම්භ කර තිබුණු ප්‍රසම්පාදන කටයුතු අත්හිටුවීමට සිදු වූ අතර ප්‍රතිපාදන රහිතව දැනට පවතින මානව සම්පත් උපයෝගයෙන් අදාළ තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, යනාදී සියළුම අංශවල කටයුතු සම්බන්ධීකරණය කළ හැකි කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |

### 3.3 කාර්යය සාධන දර්ශක

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඔසු උයන් ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගතියද සමාලෝචනය කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. කාර්යසාධන දර්ශක පිහිටුවීමට අදාළ කටයුතු ඉටුකරමින් පවතින බව හා ඒ අනුව ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සමාලෝචනය කිරීමට කටයුතු කරන බව. | කාර්යසාධන දර්ශක කඩිනම් පිහිටුවා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය. |

### 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සමඟ 2022 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත්කර තිබුණු නමුත් 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය යටතේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව එම වාර්තාව නිවැරදිව පිළියෙල කර නොතිබුණි. | අදාළ රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව වාර්ෂික කාර්ය සාධන වාර්තා සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වාර්ෂික ගිණුම් සමඟ නිවැරදි ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසානවී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2023 මැයි 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | සංශෝධන වලින් පසුව පාර්ලිමේන්තුවේ සභාගත කිරිමට අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, නියමිත ආකෘතියේ පිළියෙල කර නියමිත කාල සීමා තුළ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ 4.2.1(ඉ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩිනොවන කාලයක් තුලදී නිති පතා යාවත්කාලීන කරනු ලැබිය යුතු වුවත් එකී විධි විධාන ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම විධිමත් පරිදි යාවත් කාලීනව පවත්වාගෙන යාමට සටහන් කර ගත් බව. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව හා පෞද්ගලික ආරක්ෂක සේවා සැපයුම් කරුවන් අතර සේවා ගිවිසුම් කොන්දේසිවලට අනුව ආරක්ෂක නිලධාරීයෙකු අඛන්ඩව පැය 12කට වඩා වැඩියෙන් සේවයේ යෙදුවහොත් ඒ සඳහා කිසිදු ගෙවීමක් නොකළ යුතු වුවද, ඊට පටහැනිව රෝහල් 11 ක හා ඔසු උයන් 6 ක පැය 12 ඉක්මවා යොදවා තිබුණු සේවා මුර 2,619 ක් වෙනුවෙන් රු.2,668,317 ක් ගෙවා තිබුණි. තවද, එක් එක් දිනයේ සේවයේ යෙදවිය යුතු නියමිත නියාමකයින් සංඛ්‍යාව සේවයේ නොයෙදවූ විට ඒ සඳහා එක් පුද්ගලයෙකුගේ දිනක වැටුපක් අඩු කිරීමට හා නොපැමිණි සේවකයින් සඳහා නියමිත වැටුප නොගෙවිය යුතු බව දක්වා තිබුණද, ඊට පටහැනිව නියමිත සේවකයින් දෛනිකව සේවයේ නොයෙද වූ සේවා මුර 562 ක් වෙනුවෙන් රු. 598,473 ක්ද පෞද්ගලික ආරක්ෂක සේවා සැපයුම් කරුවන් 4 දෙනෙකුට ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුවේ රෝහල් හා ඔසු උයන්වල අධීක්ෂණ නිලධාරීන්ගෙන් මේ පිළිබඳව විමසා ඇති අතර පිළිතුරු ලද පසු ප්‍රගතිය වාර්තා කරන බව හා මැදවච්චිය ආයුර්වේද රෝහලේ ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් 2022 ජුනි හා ජුලි මාසයේ ඉදිරිපත්කර ඇති බිල්පත්වලින් සේවා මුර 104ක් අඩුකරන ලද බව. | ප්‍රසම්පාදන ගිවිසුම් කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානයකින් කටයුතු කළයුතු අතර ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව කළ ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ජුනි සිට දෙසැම්බර් දක්වා ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධිත ආයතන 18ක ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ රු. 74,759,059 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ 1.2.1 (ඉ), 2.12, 4.2.2, 4.2.3 සහ 4.3 යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව දිනපතා පැය 24 ම ආවරණය වන පරිදි සියළුම සේවා ලක්ෂ්‍යාවල නිලධාරීන් යොදවන බව තහවුරු කර ගැනීම පිණිස විධිමත්ව අධීක්ෂණ නිලධාරියකු පත්කර දිනපතා නම් ලැයිස්තු ලබා ගැනීම, ලොග් සටහන් පරීක්ෂා කිරීම, වරින්වර සේවා ලක්ෂ්‍යා පරීක්ෂා කර බැලීම යනාදී අභ්‍යන්තර පරීක්ෂාවන් සිදුකළ බවට තොරතුරු අනාවරණය නොවුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මට අනුව විධිමත් පරිදි යාවත්කාලීනව ප්‍රසම්පාදන කටයුතු පවත්වාගෙන යන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදනයන් මෙහෙයවිය යුතු අතර කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කර ගිවිසුම් කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කිරීමටත් සුදුසු පාලන ක්‍රම අනුගමනය කළ යුතුය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කළ බව හා විනිවිදභාවයෙන් කටයුතු කළ බව තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ජුලි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් පරිශ්‍රයන්හි පිරිසිදු කිරිමේ සේවාව සැපයීම සඳහා වූ රු.1,947,258 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.3, 2.5.1 (ආ), 2.6.1(ආ)(i) සහ 4.2.2, යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටුවල සාමාජිකයින් අදාළ කමිටු සඳහා ප්‍රමුඛත්වය ලබාදී නොතිබුණු අතර ප්‍රසම්පාදන කාල සටහන සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබා දී නොතිබුණු බැවින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි.එමෙන්ම අදාළ කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් සේවකයින්ගේ නම අත්සන ලිපිනයන් ඇතුළත් වාර්තාවක්ද, පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍යවල සංඝටකයන් හා භාවිතයට සුදුසු බවට විධිමත් තත්ත්ව සහතිකයක්ද, දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණු අතර සේවකයන්ට නිල ඇඳුම් හා පැළඳීම සඳහා හැඳුනුම්පත් සැපයීමටද කටයුතු කර නොතිබුණි. තවද සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධ තොරතුරු හා සේවකයින්ට ගෙවන ලද මාසික | කොවිඩ් වසංගතය හා අරගලකාරි තත්ත්වය නිසා ඇඳිරිනීතිය ක්‍රියාත්මක වීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු රැස්කිරීම ප්‍රමාද වූ බව. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව සේවකයින්ගේ නම්, අත්සන හා ලිපිනයන් ඇතුලත් වාර්තාවක් ගෙන්වා ගෙන ඇති බව. සේවකයින්ට නිල ඇඳුම් හා හැඳුනුම් පතක් ලබා දෙන ලෙස කොන්ත්‍රාත් ආයතනය දැනුවත් කර ඇති බව. සේවයට වාර්තා කිරිම හා පිටවීම සම්බන්ධ වාර්තාවක් ආයතන අංශය විසින් පවත්වාගෙන යනු ලබන බව.මේ වර්ෂයේදී ලංසු කොන්දේසි ප්‍රකාරව පවිත්‍රතා සේවා සපයන ආයතන තම සේවකයින්ට නිසි පරිදි වැටුප් හා දිමනා ගෙවන බවටත්, සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කරන බවටත් තහවුරු කරන | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදනයන් මෙහෙයවිය යුතු අතර කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමටත් ගිවිසුම් කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කිරීමටත් සුදුසු පාලන ක්‍රම අනුගමනය කළ යුතුය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කළ බව හා විනිවිදභාවයෙන් කටයුතු කළ බව තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| වැටුප, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට කරන ලද ප්‍රේෂණ, යනාදී තොරතුරුද කාලීනව සැපයීමට කටයුතු කර නොතිබුණි. | ලෙස සේවා සපයන ආයතනයට දන්වා ඇති බව හා 2023 වර්ෂයේදී ගෙවීම් කිරිමට ප්‍රථම අදාළ කරුණු තහවුරු කරගෙන ගිවිසුම ප්‍රකාරව කටයුතු කිරිමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. | |

## 3.6 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා භාවිතා කරන ඉඩම් 27 ක් පැවැති නමුත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, බොරැල්ල ශික්ෂණ රෝහල ඇතුළුව රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල හා සංචාරක බංගලා පිහිටි ඉඩම් 19 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | මෙම ඉඩම් පවරා ගැනිමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන අතර ප්‍රගතිය වාර්තා කරන බව. | අදාළ ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ යාවත්කාලීන හා නිවැරදි තොරතුරු කොම්ප්ටෝලර් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි. | ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධ වාර්තාව නියමිත දිනට වාර්තා කර ඇති අතර අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් වාර්තා සකස්කර යැවීමට කටයුතු කරමින් පවතින බව හා ප්‍රගතිය ඉදිරියේදි වාර්තා කිරිමට සටහන් කර ගත් බව. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාල සීමාවන් තුළ අදාළ වාර්තා සැපයීමට කටයුතු කළ යුතුය. |

## 3.7 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හම්බන්තොට චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහලේ දැල් වැටෙන් කොටසක් සොරුන් විසින් කපාගෙන ගොස් තිබුණු අතර එහි අලාභය රු. 763,360 ක් ලෙස දෙපාර්තමේන්තු ඉංජිනේරු විසින් තක්සේරු කර තිබුණි. රෝහලේ ආරක්ෂක සේවා ගිවිසුමේ 25 වගන්තිය ප්‍රකාරව අලාභයෙන් සියයට 40ක් ආරක්ෂක සේවා සමාගමෙන් අයකර ගැනීමට සිද්ධියට අදාලව පත්කළ පරීක්ෂණ නිලධාරීයා තීරණය කර තිබුණි. ඒ අනුව ඉංජිනේරු තක්සේරුවෙන් සියයට 40ක් හෙවත් රු. 305,344 ක් අය කරගැනීමට කටයුතු නොකර අදාළ පරීක්ෂණ නිලධාරීයා විසින්ම ඉංජිනේරු එකඟතාවයකින් තොරව අදාළ අලාභය රු. 252,235 ක් ලෙස සංශෝධනය කර ඉන් සියයට 40 ක් හෙවත් රු.100,894 ක් පමණක් ආරක්ෂක සේවා සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. | හම්බන්තොට චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහලේ දැල් වැටෙන් කොටසක් කැපීමේ සිද්ධියට අදාළව පත්කරන ලද පරීක්ෂණ නිලධාරීවරයා ආරක්ෂක සේවා සැපයූ ආයතනය හෝ එහි සේවක පිරිස හෝ සෘජුවම මෙම පූර්ණ අලාභය වගකීව යුතු නොවන බවට නිර්දේශ කර ඇති බැවින් සිදු වූ අලාභයෙන් සියයට 40 ක් එනම් රු.100,894 **ක් හා සියයට** 25 ක අධිභාරයක් එම ආයතනයෙන් අයකර ගැනිමට නිර්දේශ කර ඇති බව හා ඒ අනුව අදාල මුදල අයකර ඇති බව. | ඉංජිනේරු විසින් තක්සේරු කර තිබූ නිවැරදි අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මංචංතොඩුවායි ආයුර්වේද රෝහලේ සේවය කර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරුවී තිබුණු ආයුර්වේද වෛද්‍යවරයෙකුට 2012 ජූලි මාසයේ සිට 2013 සැප්තැම්බර් මාසය දක්වා මාස 15 ක් තුළදී දෙපාර්තමේන්තුව විසින් වැටුප් ලෙස රු.548,376 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු නොකර සියයට 25ක අධිභාරයක්ද ද සමඟ 2023 මාර්තු 02 දින වන විට රු.354,600ක් පමණක් අයකර ගෙන තිබුණි. මෙම සිද්ධියට වසර 10කට අධික කාලයක් ගතවී තිබුණු නමුත් ඉතිරි රු.330,870 ක මුදල වහාම අයකර ගැනීම සඳහා අදාළ වෛද්‍යවරයාට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් රෙගුලාසි 104 (2) "ආ"පරිදි වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව පරීක්ෂණ පවත්වා ඇති අතර වරදකරු වූ ආනන්ද ක්‍රිෂ්ණන් මහතාගෙන් ඔහුට වැටුප් වශයෙන් ගෙවන ලද රු.548,376 ක් හා සියයට 25 ක දඩ මුදල වශයෙන් රු.137,094 **ක්** ලෙස අයවිය යුතු මුළු මුදල වූ රු.685,470 ක මුදලින් රු.354,600 ක් අයකරගෙන ඇති අතර තවදුරටත් රු.330,870**ක්** අය කිරිමට ඇති බව. අවසන්වරට 2023 **මාර්තු** 02 දින වාරිකයක් ගෙවා ඇති බව. | මෙම සිද්ධියට වසර 10කට අධික කාලයක් ගතවී ඇති බැවින් හිඟ මුදල් වහාම අයකර ගැනීමට හෝ මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් රෙගුලාසි 104 (2) "ආ" ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හෝ කටයුතු කළ යුතු අතර, පිරිස් පාලන හා වැටුප් පාලන අංශ අතර යාවත්කාලීන අඛණ්ඩ සම්බන්ධතා තහවුරු කෙරෙන පාලන ක්‍රම හඳුන්වා දීමටද කටයුතු කළ යුතුය. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද දෙපාර්තමේන්තුව සතුව අක්කර 272 කට අධික වපසරියක් සහිත ඔසු උයන් 07 ක් පැවැතියද එම උයන්වලින් ලැබෙන ඵලදාව ආයුර්වේද රෝහල් වල ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම පිණිස විධිමත් වැඩපිළිවෙලක් භාවිතා කර නොතිබුණි. | මෙම සියළු ඔසු උයන් පර්යේෂණ ඔසු උයන් වනඅතර මේ වනවිට ඔසු උයන් මගින් පර්යේෂණ හා ව්‍යාපෘති සේවාවන්ට අමතරව ඔසු වගා කිරීමේ හා අස්වනු රෝහල් වෙත ලබාදීමේ කටයුතු ආරම්භ කර ඇති බව හා ඉදිරියේදී විධිමත් ලෙස ඔසු උයන්වල ඔසු අස්වැන්න ලබා ගැනීමටත්, අත්‍යවශ්‍ය ඖෂධ ඔසු උයන්වල වගා කිරීමටත්, ඒවා රෝහල් වෙත ලබාදීමටත් මේ වනවිට කටයුතු සැලසුම් කර ඇති බව. | ඔසු උයන්වලින් ලැබෙන ඵලදාව ආයුර්වේද රෝහල් වල ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීමට හා ඒ පිළිබඳ ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීමට විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතුව වාහන 55 ක් පැවැති අතර මෙම වාහනවලට අදාළ ලොග් පොත් හා ධාවන සටහන් සම්බන්ධයෙන් අදාළ රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම, ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබීම, වාහන සඳහා ඉන්ධන පිරවීමේදී එම කටයුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර නොතිබීම, අවස්ථා කිහපයකදී සිදුව තිබුණු ඉන්ධන සොරකම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවර නොගැනීම සහ රියදුරන්ගේ විනය පාලනය සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රම අනුගමනය නොකිරීම යනාදී කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය හා වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොපැවැති බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව සතු වාහනවල ලොග් සටහන් පොත් හා ධාවන සටහන් සම්බන්ධයෙන් අදාළ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව. ඉන්ධන පිරවීමේදී එම කටයුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධික්ෂණය යටතේ සිදු කිරිමට කටයුතු කරන බව. ඉන්ධන සොරකම් සම්බන්ධයෙන් මු.රෙ 104 පරික්ෂාව සිදු කර ඇති අතර එහි නිර්දේශ අනුව ඉදිරියේදී කටයුතු කරන බව හා ප්‍රවාහන අංශය භාරව සිටින මාණ්ඩලික නිලධාරි තනතුරේ පුරප්පාඩුව කඩිනමින් පුරවා ගැනිමට යටත්ව ප්‍රවාහන අංශයේ ප්‍රතිසංවිධාන කටයුතු හා රියදුරන්ගේ විනය සම්බන්ධ කටයුතු විධිමත් පරිදි සිදු කිරිමට සැලසුම් කර ඇති බව. | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම් පරිදි, පාලන පටිපාටි යථා පරිදි සිදුවන බවට නිරීක්ෂණය නොවන බැවින් ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | ධාවන තත්ත්වයේ නොපවතින, අලුත්වැඩියා කිරීම ඵලදායි නොවන හා ඵලදායි වාහන පිළිබඳ නිවැරදි තොරතුරු 2020 සැප්තැම්බර් 30 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 ප්‍රකාරව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ වාහන පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත විද්‍යුත් ලිපිනයට යොමු කර ඇති අතර එම තොරතුරු ලැබී නොමැති බව සඳහන් කරමින් 2021 ජනවාරි 29 දිනන යොමු කර ඇති ලිපියට අනුව නැවත එම තොරතුරු 2021පෙබරවාරි 17 දින ෆැක්ස් මගින් යොමු කර මුල් පිටපතද යවා ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කාලිනව ඉදිරිපත් කළ යුතු වාර්තා අප්‍රමාදව පිළියෙල කර යැවීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රෝහල් 04 ක ප්‍රධාන වෛද්‍ය නිලධාරින් 04 දෙනෙකුගෙන් හා මුදල් අයකැමියන් 05 දෙනෙකුගෙන් පමණක් රු.32,500 ක ඇප තැන්පතු ලබාගෙන තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් සිදු කිරීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන 6000-0-0-13-0-084 දරන තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණු අතර අනෙකුත් රෝහල්වල ප්‍රධාන වෛද්‍ය නිලධාරීන්ගෙන් හා මුදල් අයකැමියන්ගෙන් ඇප තැන්පතු ලබා නොගැනීමට හේතු ඉදිරිපත් නොවුණි. | තැන්පත් ගිණුමේ ඇති ශේෂයන් වෙනුවෙන් විධිමත් පරිදි ඉතිරි කිරීම් ගිණුම් විවෘත කර අවශ්‍ය කටයුතු කිරිමටත්, අදාළ නිලධාරින් දැනුවත් කර ඇප තැන්පත් ලබා ගැනිමටත් කටයුතු කරන බව. | විධිමත් පරිදි ඉතිරි කිරීම් ගිණුම් විවෘත කර ඇප තැන්පතු තැබීමට කටයුතු කළ යුතු අතර ඇප තැන්පත් තැබිය යුතු සියලුම නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබාගත යුතුය. |
| (ඉ) | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් 2023 ජූලි 11 වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු. 28,342,712 ක මුළු මුදල අනාර්ථික වියදමක් විය. | නාවින්න පර්යේෂණායතනයේ පවතින යන්ත්‍ර හා උපකරණ පිළිබඳව විශේෂඥ කමිටුවක් මඟින් පරීක්ෂණයක් සිදුකර මේ සම්බන්ධයෙන් ඉදිරිකටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු කරන බව. | සියළුම යන්ත්‍ර ඵලදායි ලෙස උපයෝජනය කිරීමට හෝ ආයුර්වේද රෝහල්වල හෝ ආයුර්වේද සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම සඳහා ලබාදීමට කටයුතු කළ යුතු අතර අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම මිලදී ගැනීම සඳහා දායක වූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9,11 හා 11.2 වගන්ති ප්‍රකාරව, ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු අතර තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතුව තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ලඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළ යුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව හා තිරසාර සංවර්ධන අරමුනු ලගා කර ගැනිමට අදාලව ඉලක්ක හා දර්ශක හඳුනාගැනිමට කටයුතු සිදු කර ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන බව. | තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේද අදාළ දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ යාවත්කාලීන කළමනාකරණ තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීමට අපහසුව පැවැති අතර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පාලනය, කාර්යසාධන පාලනය, වැටුප් පාලනය, අතිකාල වියදම් පාලනය, පුද්ගලික ලිපිගොනු පාලනය යනාදී පාලනයන් දුර්වල මට්ටමක පැවැති බව නිරීක්ෂණය විය. | මෙම කටයුතු ඉටුකිරිම සඳහා 2023 වර්ෂයේද ප්‍රතිපාදන සැලසී නැති අතර ස්වේච්ඡාවෙන් සේවාව ලබා දිම සඳහා ඉදිරිපත් වි ඇති වෛද්‍යවරයෙකුගේ අධික්ෂණය යටතේ තොරතුරු තාක්ෂණ පුහුණු කටයුතු සඳහා බඳවාගෙන ඇති පුහුණු නිලධාරීන් සමඟ මෙම කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව හා ඉදිරියේදී ප්‍රතිපාදන සලසා ගැනීමෙන් පසු ක්‍රමවත් වැඩපිළිවෙල ආරම්භ කිරිමට කටයුතු සැලසුම් කර ඇති බව. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, යනාදී සියළුම අංශවල කටයුතු සම්බන්ධිකරණය කළ හැකි කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 2,362 ක් වුවද, එදිනට තථ්‍ය කාර්යය මණ්ඩලය 1,371 ක් වූයෙන් අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 42 කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 969 ක් විය. මෙම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 83 ක් ද්විතීයික හා තෘතියික මට්ටම්වල පුරප්පාඩු 368 ක් සහ ප්‍රථමික මට්ටමේ පුරප්පාඩු 241 ක් පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මෙන්ම ඒ යටතේ වූ රෝහල් වල කාර්යසාධනයට දැඩි බලපෑමක් සිදු වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී රජයේ සේවයේ පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් පත්කර ඇති කැබිනට් අනු කමිටුවේ නිර්දේශ යටතේ බහුකාර්ය සංවර්ධන සහායකයින් 277ක් ආයුර්වේද සේවා සහයකයින් ලෙස බඳවා ගෙන පුරප්පාඩු 108 ක් සඳහා උසස්වීම් ලබා දී ඇති බව හා ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 62 කු බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සහ රෝහල්වල අත්‍යවශ්‍ය තනතුරු වලට ප්‍රමුඛතාව දෙමින් පවතින මානව සම්පත්වලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා කාර්යමණ්ඩල ප්‍රතිසංවිධානයක් සිදු කළ යුතුය. |
| (ඇ) | බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරි තනතුරු 18 ක් හා පර්යේෂණ සහායක තනතුරු 12 ක් අනුමත කරගෙන තිබුණද, ඉන් කිසිවෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහලට පර්යේෂණ කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණි. මේ අනුව ආයුර්වේද පර්යේෂණ රෝහල් පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යසාධනයට අහිතකර බලපෑමක් සිදු වී තිබුණි. | ආයුර්වේද පර්යේෂණායතනයේ සේවයේ යෙදි සිටි පර්යේෂණ නිලධාරීන් 6 දෙනෙකු 2021 වර්ෂයේ සිට විද්‍යාත්මක සේවයට ඇතුළත්ව ඇති බව. 2019 වර්ෂයෙන් පසු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් බඳවා ගැනීම් සිදු කර නැති බව. හම්බන්තොට ආයුර්වේද පර්යේෂණ රෝහලට පර්යේෂණ කාර්යය මණ්ඩලයක් අනුමත කර නැති අතර මූ.රෙ. 71 ප්‍රකාරව ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන බව. | ආයුර්වේද පර්යේෂණ රෝහල් පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යසාධනය ලබා කර ගැනීමට සුදුසු පරිදි කාර්යමණ්ඩල ප්‍රතිසංවිධාන සිදුකළ යුතුය. |